# කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

කුඹුරුගමුවේ වජිර නාහිමි

කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිවන ශතවර්ෂයේ මෙරට වැඩ විසූ අති සම්භාවනීය සංඝ පීතෲන් වහන්සේ ය. ආගම් භේදයකින්, නිකාය භේදයකින්, දේශපාලන භේදයකින් තොර ව හැම දෙනාගේ ම ගෞරවය හා විශ්වාසය දිනා සිටි උන්වහන්සේ, අගය කියා නිම කළ නොහැකි තරම් ගෞරවනීය ප්‍රියංකර සංඝනායකතුමෙකි, ජන සම්භාවනාවට පත් වන්දනීය සිල්වතෙකි, ප්‍රියශීලී ආචාර්යවරයෙකි, සම්භාවනීය පඬිවරයෙකි, මහනීය තේනාවරයෙකි, ගුණයෙන් පිරිපුන් මහා යතිවරයාණ කෙනෙකි.

මෙ උදාරතර සංඝ නායකයාණෝ උපත ලැබුයේ ක්‍රි. ව. 1891 පෙබරවාරි 07 වෙනිද කිරිවත්තුඩුව නම් ගම් පියසේ ය. සිය පියාණන්ගෙන් මූලික අධ්‍යාපනය ලැබ ඉන් අනතුරු ව බෙලිගම්මන විද්‍යාවර්ධන පිරිවෙනට ඇතුළත් ව සිංහල පාලි සංස්කෘත භාෂා පිළිබඳ මූලික ඉගෙනීමත්, ප්‍රව්‍රජ්‍යාවට අවශ්‍ය බණ දහම් පුහුණුවත් ලබා ගත්තේ ය. 1902 ජූනි 10 වෙනිද හුණුපිටියේ විජයසුන්දරාරාම විහාරස්ථානයේ දී රත්මලානේ ශ්‍රී ධර්මාරාම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, ලුණුපොකුණේ ශ්‍රී ධම්මානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ යන විද්‍යාලංකාර පරිවේණාධිපතීන් වහන්සේලාගේ ආචාර්ය උපාධ්‍යායත්වයෙන් පැවිදි බව ලැබූහ. 1911 වර්ෂයේ දී මහනුවර මල්වතු මහා විහාර උපෝසථාගාරයේ දී උපසම්පදාව ලැබූහ.

1911 දී උසස් අධ්‍යාපනය සඳහා විද්‍යාලංකාර පිරිවෙනට ඇතුළත් ව භාෂා ශාස්ත්‍ර හදාරා රාජකීය පණ්ඩිත උපාධිය සම්මාන සහිත ව දිනා ගත්හ. විද්‍යාලංකාර පිරිවෙණේ ආචාර්යවරයකු ලෙස

---

© පූජ්‍ය කුඹුරුගමුවේ වජිර නාහිමි
සංස්. පූජ්‍ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත හිමි, ආර්. එම්. ඩබ්. රාජපක්ෂ, ඉන්ද්‍රා දසනායක, රොහිණිලා පතුල්
මානව ශාස්ත්‍ර පීඨ සංග්‍රහය, 5 කලාපය, 2008, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.